සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

| | | |
|---|---|---|
| **6 ශ්‍රේණිය** | පළමු වාර පරීක්ෂණය - 2019 | **16 S** |

නම ..............................................

**ඉස්ලාම් ධර්මය I - කොටස** **කාලය පැය දෙකයි**

උපදෙස් : ★ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්ණයකට ලකුණු 02 බැගින් හිමිවේ.
★අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

✶ නිවැරදි පිළිතුර සොයා යටින් ඉරක් අඳින්න.

(01) "ඊමාන්" යන අරාබි පදයේ අර්ථය වන්නේ

1. සත්‍යය 2. විශ්වාසය 3. විනය 4. ආදරය

(02) විශ්වාස කළ යුතු කරුණු වලින් දෙවැනිය කුමක්ද?

1. අල්ලාහ් ව 2. රසුල්වරුන් ව 3. මලාඉකාවරුන්ව 4. ආගම් ග්‍රන්ථ ගැන

(03) අල්ලාහ් ගෙන් නබි වරුන්ට වහී දූත මෙහෙවරය රැගෙන ආ මලක්වරයාණන්,

1. මීකාඊල් (අලෛ) 2. ජිබ්රීල් (අලෛ)
3. රකීබ් (අලෛ) 4. අතීද් (අලෛ)

(04) මරණින් මතු ජීවිතය හඳුන්වන අරාබි පදය වන්නේ,

1. තව්හීද් 2. රිසාලත් 3. මආද් 4. තම්ජීද්

(05) අල්ලාහ් විසින් මෙම පොළොවේ මවන ලද ප්‍රථම මිනිසා වන්නේ

1. ආදම් (අලෛ) 2. ඊසා (අලෛ)
3. මූසා (අලෛ) 4. දාවුද් (අලෛ)

✶ පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද යොදන්න.

(06) අප ජීවත් වන පොළොව මැව්වේ අල්ලාහ් ය ( )
(07) ඉස්ලාම් හි අනිවාර්‍යය මූලිකාංග හයක් වේ ( )
(08) වත්කම් තිබෙන්නා වූන් හජ් වන්දනාවේ නිරත විය යුතුයි ( )
(09) ඉස්ලාම්හි අනිවාර්ය දෙවන වගකීම සව්මය ( )
(10) පිරිසිදුකම ඉස්ලාමයේ අඩක් වේ ( )

✶ හිස්තැනට ගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න

(11) අයහපත් ගුණයක් නොවන්නේ ____________

1 - ඊර්ෂ්‍යාව 2-උඩගුකම 3-ඉවසීම 4-වෛරය

(12) වුළුහි ෆර්ලයන් වල ගණනය ____________ වේ

1 - පහයි 2-හයයි 3-හතරයි 4-තුනයි

(13) අල්ලාහ්ට ආදේශ කරන්නන් ____________ යන නමින් හැඳින්වේ

1 - කාෆිර් 2-මුෂ්රික් 3-ඉබ්ලීස් 4-මුනාපික්

(14) ඉස්ලාම් යනු ____________ අර්ථය වේ

1 - සාමය 2-ගැටළුව 3-අපරාධය 4-භේදය

(15) වුළු බිඳෙන කාර්යයන් වන්නේ ____________ වේ

1 - ෂර්ත්වේ 2-මුබ්තිලාත් 3-සුන්නත් 4-වාජිබ්

★ යා කරන්න / සම්බන්ධ කරන්න

(16) පසින් මවන ලද අය වන්නේ — ෂහාදා

(17) ඉස්ලාමය වැළඳ ගැනීම සඳහා කිවයුතු ප්‍රතිඥාව වන්නේ — මිනිසා

(18) ඉස්ලාම් හි අවසන් අනිවාර්ය කාර්යය වන්නේ — මලක්වරුන්

(19) ධනය පිරිසිදු කරන්නා වූ අනිවාර්ය කාර්ය වන්නේ — හජ්

(20) ආලෝකයන් මවන ලද අය වේ — සකාත්

## II - කොටස (2x20=40)

★ පළමු ප්‍රශ්නය ඇතුලු ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න

(01) (i) අප විශ්වාස කළ යුතු අනිවාර්ය කරුණු කීයද?

(ii) "තව්හීද්" යන පදයේ විරුද්ධ පදය ලියන්න.

(iii) මලක්වරුන්ගේ නායකයාණන් ලෙස හඳුන්වන්නේ කවුරුන්ද?

(iv) සුළඟ, ජලය, ගින්න ආදීන් භාරව සිටින මලක්වරයාණන් කවුරුන්ද?

(v) මාඋන් තහූර් ලෙස හඳුන්වන්නේ කුමක්ද?

(vi) ආරවුල් ඇති කරන ෂෙතාන්ගේ නායකයාණන් කවුරුන්ද?

(vii) පෘතුවියේ අල්ලාහ් ගේ නියෝජිතයා ලෙස හඳුන්වනුයේ කවුරුන්ද?

(viii) ජලය භාවිතා කිරීම සඳහා අපොහොසත් අවස්ථාවක සලාතය ඉටුකරන ක්‍රමය මොනවාද?

(ix) සලාතය ඉටු නොකළ අය පිවිසෙන්නා වූ නිරයේ නාමය කුමක්ද? (ලකුණු 2x10=20)

(02) (i) නබිවරුන් අතරින් විශේෂිත වූවන් හඳුන්වන්නේ කෙසේද?

(ii) ආදම් (අලෛ) තුමානන්ගේ භාර්යාවගේ නම කුමක්ද?

(iii) නබිවරුන් සිව් දෙනෙකුගේ නම් සඳහන් කරන්න. (ලකුණු 3+3+4=10)

(03) (i) ජිබ්රීල් (අලෛ) තුමාණන් සඳහා වූ විශේෂිත නාමයක් සඳහන් කරන්න.

(ii) සූර් නම් නලාව පිඹින්නා වූ මලක්වරයාගේ නම සඳහන් කරන්න.

(iii) මිනිසා හා මලක්වරුන් අතර තිබෙන්නා වූ වෙනස්කම් දෙකක් නම් කරන්න. (ලකුණු 3+3+4=10)

(04) (i) අනිවාර්ය සව්මය (ෆර්ල් සව්මය) ඉටුකරන මාසය හැඳින්වෙන්නේ කෙසේද?

(ii) අල්ලාහ් විසින් පිළිගනු ලබන හජ් ක්‍රියාවන් සඳහා වූ පරිත්‍යාගය කුමක්ද?

(iii) ඉස්ලාම් හි අනිවාර්‍ය මූලික ඉබාදත් සඳහන් කරන්න. (ලකුණු 3+3+4=10)

(05) (i) චිත්ත පාරිශුද්ධය ඇති කරන්නා වූ ක්‍රියාවන් දෙකක් සඳහන් කරන්න.

(ii) නජීස් හි කොටස් නම් කරන්න.

(iii) සාමාන්‍ය නජීසය සඳහා උදාහරණ 04 ක් නම් කරන්න. (ලකුණු 3+3+4=10)

**පළමුවාර පරීක්ෂණය 2019**
**6 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය**
**ඉස්ලාම් ධර්මය**

## I - කොටස

| | | |
|---|---|---|
| 1) විශ්වාසය | 2) මලාඉකාවරුන් | 3) ජිබ්රීල් (අලෛ) |
| 4) මආද් | 5) ආදම් (අලෛ) | 6) ✓ |
| 7) ✗ | 8) ✓ | 9) ✗ |
| 10) ✓ | 11) ඉවසීම | 12) හයයි |
| 13) මුෂ්රික් | 14) සාමය | 15) මුබ්තිලාන් |
| 16) මිනිසුන් | 17) ෂහාදා | 18) හජ් |
| 19) සකාත් | 20) මලාඉකාවරුන් | |

## II - කොටස

| | | |
|---|---|---|
| 1) හයයි | 2) ෂිර්ක් | 3) ජිබ්රීල් (අලෛ) |
| 4) මීකාඊල් (අලෛ) | 5) ඉතා පිරිසිදු ජලය | 6) ඉබ්ලීස් |
| 7) මිනිසා | 8) තයම්මම් කර | 9) හතයි |
| 10) සකර් | | |

(2) 1) රසුල්වරුන්

2) හව්වා (අලෛ)

3) සුදුසු උත්තර තිබේ නම්

(3) 1) අර්රූහ්, නාමුසුල් අඌලම්, රූහුල් කුද්ස්

2) ඉස්රාෆීල් (අලෛ)

3) මිනිසුන් පසින් මවන ලදී.

මාලාඉකවරුන් ආලෝකයින්

මිනිසුන් අතරේ ස්ත්‍රී පුරුෂ භේද ඇත. මලාඉකවරුන් අතරේ එසේ නැත.

(4) 1) රමධාන් මාසයේ

2) ස්වර්ගය

3) කලිමාව, සලාතය, සකාත්, උපවාසය, හජ්

(5) 1) අල්කුර්ආනය පාරායනය කිරීම

දික්ර්හි යෙදීම - තස්බිහ් කිරීම

සලවාත් ඉසිලීම - පව්වලට සමාව අයදීම

2) 1- සාමාන්‍ය නජීස්

2- මෘදු නජීස්

3- දැඩි නජීස්

3) මළපහ, මූත්‍රා, රුධිරය, සැරව, මත්පැන්, මැරුණු සතුන්